# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1099 /2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திகதி
Date — 04/07/2024
පැය 2245

## මාධ්‍ය නිවේදනය

**වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයකට සම්බන්ධ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.**

2024.06.22 වන දින සවස් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ බඩෝවිට ප්‍රදේශයේදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් අනුව හෙරොයින් ග්‍රෑම් 02 මිලිග්‍රෑම් 200ක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 51ක් වන කහතුඩුව, පොල්ගස්ඕවිට ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම සැකකරුගේ ජංගම දුරකතනය ඔස්සේ සිදුකරන ලද වැඩිදුර විමර්ශනයේදී සැකකරු තාවකාලිකව පදිංචිව සිටි පැපිලියාන ප්‍රදේශයේ නිවසක සඟවා තිබූ විදේශ රටක නිෂ්පාදිත පිස්තෝල වර්ගයේ ගිනි අවියක්, මිලිමීටර් 09 වර්ගයේ ජීව උණ්ඩ 10ක් හා පතරොම් ගැබ් 01ක් පොලිස් භාරයට ගෙන ඇත. මෙම සැකකරු ගරු අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු රැඳවුම් නියෝග මත රඳවා තබාගෙන වැඩිදුර විමර්ශනය සිදු කිරීමේදී සැකකරුගෙන් අනාවරණය කරගත් තොරතුරු අනුව 2024.06.26 වන දින ඇල්පිටිය ඌරගස්මංහන්දිය ප්‍රදේශයේ නිවසක සඟවා තිබූ පිස්තෝල ගිනි අවියක්ද පොලිස් භාරයට ගෙන ඇත.

සැකකරු සම්බන්ධයෙන් වැඩිදුරටත් විමර්ශන සිදුකිරීමේදී මෙම සැකකරු 2024.02.26 වන දින උදෑසන කාලයේ ඇල්පිටිය පොලිස් වසමේ පතිරාජවත්ත ප්‍රදේශයේ **අවුරුදු 51 ක් වූ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකුට** යතුරු පැදියකින් පැමිණි නාඳුනන පුද්ගලයින් දෙදෙනෙකු විසින් වෙඩි තබා ඝාතනය කිරීමේ සිද්ධියේ වෙඩික්කරු බවට අනාවරණය වී ඇත. විදේශීය රටක සිටින පුද්ගලයෙකු විසින් මෙම මනුෂ්‍ය ඝාතනය සිදු කිරීම සඳහා සැකකරුට මුදල් එවා ඇති බවටත් දැනට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**